**මඩකලපුව මහා නගර සභාව - 2023**
**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මඩකලපුව මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන, මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වැටුප් ප්‍රතිපූර්ණය කිරීම් ආරම්භක ශේෂය රු.13,795,223ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ නමුත් නැවතත් වර්ෂ අවසාන යේදී ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය ඉදිරි මූල්‍ය ප්‍රකාශන යේ පසුගිය වර්ෂ ගැලපීම්වල නිවැරදි කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ගොඩනැගිලි අයදුම්පත් ලබා නොගෙන ඉදිකිරීම් සිදුකළ පුද්ගලයින් 23කගෙන් අයකළ යුතු හිඟහිටි දඩගාස්තු රු.1,696,247ක් මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව. | -එම- |
| (ඇ) | ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවට නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් ගෙවිය යුතු කසල බැහැරකිරීමේ ගාස්තු රු.836,449ක් සහ ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාල දුරකථන, ජල හා විදුලි ගාස්තු එකතුව රු.359,908ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙය නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී මහජන පුස්තකාල 09ක් සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.554,583ක් වටිනා පොත් 1,884ක් හා වටිනාකම සඳහන් නොවූ පොත් 389ක වටිනාකම ගණනය කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත (අධිකාරය 252) | | | |
| (i) | 71 වගන්තිය | සභාව එහි පරිපාලන බල ප්‍රදේශයේ පිහිටි මාර්ගවල නාම ලැයිස්තුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | මාර්ග ගැසට් පත්‍රයේ පලකිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරමින් පවතින බව. | මාර්ග ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 212 වගන්තිය | මහනගර සභාවේ ඇස්තමේන්තුගත අයවැය වාර්තාව මහජනතාවගේ විවෘත පරිශීලනය සඳහා පුවත්පත් 02ක හෝ ඊට වැඩි සංඛ්‍යාවක හෝ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය, ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. | ඉදිරි කාලයේදි මෙවැනි දෝෂ සිදුනොවන බව. | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 104 - 110 දක්වා | නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ කාර්යාලයට ගින්නෙන් වූ අනතුර හේතුවෙන් රු.800,000ක්වූ PABX System ඇතුළු හානියට පත් ගෘහභාණ්ඩ හා අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිලි කිරීම හැර මුදල් රෙගුලාසි ප්‍රකාර කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාට දැනුම්දී විමර්ශනය සිදුකර වාර්තා ලබාගැනීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩු පිළිබඳ විමර්ශන කටයුතු සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02කට අධික කල් ඉකුත් වූ රු.28,259,240ක තැන්පතු 08ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ප්‍රවර්තන වර්ෂ ආදායමට මාරුකිරිමට පියවර ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායමට මාරුකිරිමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2014 දෙසැම්බර් 26 දිනැති අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 22ක් රක්ෂණය කර නොතිබුණි. | වාහන ලියාපදිංචි පොත් ලබාගෙන රක්ෂණය කිරිමට පියවර ගනු ලබන බව. | වාහන රක්ෂණය කිරිමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.178,416,549ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.156,875,725ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 41.025,000 | 89,067,895 | 34,795,382 | 54,272,512 | 41,000,000 | 46,577,956 | 36,727,599 | 44,644,197 |
| කුලී | 15,300,000 | 33,028,491 | 19,945,068 | 13,083,423 | 27,250,100 | 24,475,385 | 23,566,524 | 16,492,094 |
| බලපත්‍ර ගාස්තු | 18,700,000 | 28,764,226 | 25,400,154 | 3,364,072 | 16,511,000 | 23,152,047 | 23,740,059 | 2,066,751 |
| වෙනත් ආදායම් | 111,682,000 | 94,114,292 | 94,114,299 | - | 159,827,000 | 253,065,050 | 239,269,827 | 13,795,223 |
| **එකතුව** | **186,707,000** | **244,974,904** | **174,254,903** | **70,720,007** | **244,588,100** | **347,270,438** | **322,304,009** | **76,998,265** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | හිඟහිටි වරිපනම් ලෙස රාජ්‍ය අංශයේ ආයතනවලින් එකතුව රු.2,142,428ක් වර්ෂ 03කට අධික කාලයක සිට පැවැති අතර මේවා අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවල කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | වැඩිපුර හිඟ ශේෂයන් පවතින දුම්රිය දෙපාර්තමේන්තුව සහ ධීවර දෙපාර්තමේන්තු වෙත ලිපි යවා ඇති බව | හිඟහිටි ආදායම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ii) | පුද්ගලික දේපළ වන නිවාස, කඩ හා ඉඩම්වලින් සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් හා බදු රු.44,644,197කින් රු.31,170,262ක් පමණක් අයකර තිබුණි. | බිල්කළ වටිනාකම නියමිත කාලවකවානු තුළ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවැති රු.44,423,697ක වරිපනම් බදු හිඟහිටි ශේෂයෙන් රු.4,944,113ක් හෙවත් සියයට 11ක් පමණක් අයකර තිබුණි. | ආදායම් පරීක්ෂකවරුන්ගේ හිඟය හේතුවෙන් අයකිරීම් කටයුතුවල ගැටළු මතු වී තිබූ බව. | -එම- |
| **(ආ)** | මහා නගර සභා ආඥා පනතේ 247(c) වගන්තිය ප්‍රකාරව දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 05කින් රු.302,500ක වෙළෙඳ බලපත්‍ර ගාස්තු වර්ෂ 04ක සිට අයකර ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් හිඟමුදල් අයකර ගැනීමට ලිපි යවා ඇති බව. | බලපත්‍ර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 23 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක SEC/2022/03 දරන චක්‍රලේඛයට අනනුකූලව, සභාව විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කළ ස්ථාවර තැන්පතුවල පොලී ආදායමින් සමාලෝචිත වර්ෂයේ රු.4,854,181ක රඳවා තැබීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | කඩිනමින් අයකිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගතයුතුය. |
| (ආ) | රජයේ නිවාස කුලියට දීමෙන් දීර්ඝකාලයක සිට අයවිය යුතු රු.326,350ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර නොතිබුණි. | 2010 වර්ෂයේ සිට හිඟහිටිව පවතින නිවාස කුලී ගැලපීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත බව. | හිඟහිටි කුලීවලට අදාල ලිපිගොනු හඳුනාගෙන කුලී අයකිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාවට ඉඩම් කට්ටි කිරීමෙන් ලැබී තිබූ ඉඩම් 41ක වටිනාකම තක්සේරු කිරිමට පියවර ගෙන නොතිබුණි. | ඉඩම් 41හි වටිනාකම තක්සේරු කර ස්ථිර දත්ත ලබාගැනීමට කමිටුවක් ස්ථාපිත කර එහි වැඩකටයුතු සිදුකරමින් පවතින බව. | කට්ටි කිරීමෙන් ලැබුණු ඉඩම්වල වටිනාකම් තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 1947 අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 188(r) වගන්තිය ප්‍රකාරව, සභාපති හෝ කොමසාරිස්වරයා සභාව වෙනුවෙන් දැරූ වියදම් ප්‍රතිපූර්ණය කළ හැකිය. එසේ වුවත්, මහා නගර සභාවේ හිටපු කොමසාරිස්වරයාට එරෙහිව හිටපු සභාපතිවරයා විසින් පුද්ගලිකව පවරා තිබූ අංක EP/HCB/CC/02/2021 සහ අංක EP/HCB/CC/03/2021 දරන නඩුවලට සම්බන්ධිත නීතිඥවරයාට ගෙවා තිබූ රු.248,500ක් අංක BMC/GM/-59(70) 2023-04 දරන තීරණය මගින් 2023 අප්‍රේල් 28 දින සභාපතිවරයා විසින්ම ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. එසේ වුවත්, නීතියට පටහැනිව සිදුකළ අදාල ගෙවීම හිටපු සභාපතිවරයාගෙන් ආපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සභාව වෙනුවෙන් සිදුනොකළ පනතට පටහැනි වියදම් නැවත ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | මහා නගර සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම් කට්ටි කර විකිණීමේදි සභාව වෙත පවරන ලද පර්චර් 97 ක ඉඩම් කැබලි පහක් හිටපු කොමසාරිස් විසින් තමාගේ සහ තම භාර්යාවගේ නමට 2003 සිට 2006 දක්වා කාලය තුළ මාරු කර තිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වර්තාවේ සඳහන් කළද, සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව වෙත අංක BC/1829/2015 මගින් පැමිණිලි කර කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු සිදු කර අවසන් බව. | සභාව සතු ඉඩම් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ පිළිබඳව විනය බලධාරියා වෙත වාර්ථා කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 13ක් දීර්ඝකාලයක සිට අක්‍රියව පවතින නමුත් ඒවා අළුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට හෝ අපහරණය සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වාහන අළුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගබඩාවේ වර්ෂ 04කට අධික කාලයක සිට පවතින ටෝනර් 15ක් ඒවා භාවිතා කිරීමට සුදුසු මුද්‍රණ යන්ත්‍ර නොමැති වීමෙන් නිෂ්කාර්යව පැවැතුණි. | 2024 වර්ෂ භාණ්ඩ සමීක්ෂණයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනුලබන බව. | මිලදීගැනීමට පෙර අවශ්‍යතාව සැලැකිල්ලට ගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

## 3.3 වාහන පරිහරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයට අනනුකූලව 2022 අගෝස්තු සභාවට අයත් ට්‍රැක්ටර් 03ක් එන්ජිමේ විශාල අළුත්වැඩියාවන් සඳහා භාරදීම හා භාර ගැනීම් නිසිපරිදි අනුගමනය නොකර වාලච්චේනෙහි පිහිටි වාහන අළුත්වැඩියා මධ්‍යස්ථානයකට ලබාදී මෙහි අළුත්වැඩියා කටයුතු අසම්පූර්ණව වාහන එන්ජිම ගලවා තිබියදී නැවත සවිනොකර සභාවට ආපසු භාරදී තිබුණි. | අළුත්වැඩියා කිරීමට පියවර ගනු ලබන බව. | ට්‍රැක්ටර් අළුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වාහන ධාවන සටහන් මාර්ගෝපදේශයේ 13 වගන්තිය ප්‍රකාරව, සෑම අවස්ථාවකදීම ගමන පිළිබඳ විස්තර වෙන් වෙන්ව ලිවිය යුතු වේ. එසේම, දෛනිකව සම්පූර්ණ කර වාහන භාර නිලධාරී වෙත ලබාදිය යුතු වේ. එසේවුවත්, සමාලෝචිත වර්ෂ යේ ගිනි නිවීමේ ඒකකයට ලබාදුන් වාහන යේ ධාවන සටහන් සම්පූර්ණ නොකර රු.434,946ක ඉන්ධන පරිභෝජනය කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වාහන ධාවන සටහන් සම්පූර්ණ කර අදාල නිලධාරී විසින් පරීක්ෂා කළ යුතුය. |
| (ඇ) | ගිනි නිවීමේ ඒකකයේ ධාවනය වන වාහනයට ඉන්ධන පිරවීමේදී වාහන ධාවන සටහන් පොත පරීක්ෂාව, ඉන්ධන ඇණවුම් (Fuel order) සහ ගබඩා භාරකරු විසින් පරීක්ෂාව වැනි ක්‍රියාවන් අනුගමනය නොකර රු.434,946කට ඉන්ධන ලීටර් 1,021ක් පුරවා තිබුණි. මේ හේතුවෙන් සභාවට අයත් ඩීසල් ටැංකිය භෞතික පරීක්ෂාවේදී ලේඛනයේ ශේෂය සහ තථ්‍ය තොග ශේෂය අතර රු.231,744ක් වූ ඩීසල් ලීටර 544ක විචලනයක් පැවැතුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ලේඛනයේ ශේෂය සහ තථ්‍ය තොග ශේෂය සමානව පවත්වාගෙන යාම සඳහා ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයහි ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 113 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 40ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 04ක් සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04ද වශයෙන් සම්පූර්ණ පුරප්පාඩු 161ක් පුරප්පාඩුවීමෙන් පොදු ජනතාවට සපයනු ලබන සේවාවන් දුර්වල තත්ත්වයේ පැවැතුණි. | පුරප්පාඩු පිළිබඳව පළාත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටත්, පුහුණු හා කාර්යමණ්ඩල දෙපාර්තමේන්තුවටත් මාසික කාර්ය මණ්ඩල විස්තර සාරාංශ ඉදිරිපත් කර ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | මිය ගිය, හා සේවය අත්හිටවූ සේවකයින්ගෙන් අයවිය යුතු හිඟණය එකතුව රු.582,788ක් දීර්ඝකාලයක සිට පවතින අතර අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එක් සේවකයෙකුගේ හිඟ ණය රු.186,830ක් පමණක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු බව සහ අනෙකුත් ණය මුදල් අයකිරිමට කටයුතු කර ඇති බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවක ණය ලබාදීමේදී ඔවුන්ගේ සේවා කාලය සැලැකිල්ලට ගෙන ආපසු අයකර ගතහැකි පරිදි ණය ලබාදිය යුතුවේ. එසේ සේවා කාලය නොසලකා සේවකයින් 11කට ලබාදුන් සේවක ණයවලින් වූ හිඟණය ශේෂ රු.599,800ක් දීර්ඝකාලයක සිට අයකර ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි. | විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට පියවර ගනිමින් පවතින බව. | -එම- |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ අංක 56 දරණ පනතෙන් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික ආරක්ෂණ පනත ප්‍රකාරව, තිරුප්පෙරුම්තුරෛ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සහ අපජලය පිරිපහදු මධ්‍යස්ථානය(Night Soil Plant) සඳහා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබා ගෙන නොතිබුණි. | අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |